www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: නැගෙනහිර විශේෂ ආර්ථික කලාපය සඳහා පවතින බාධා ඉවත් කර ගැනීමට මිලිටරි ආක්‍රමනය යොදා ගැනෙයි

## Sri Lanka: Military offensive used to clear eastern Special Economic Zone

**එස්. අජන්තන් විසිනි**
**2007 ජුලි 09**

ශ්‍රී ලංකාන්ඩුව නැගෙනහිර පලාතේ ත්‍රිකුනාමල දිස්ත්‍රික්කයෙහි සාම්පූර් හා නැගෙනහිර මුතූර් ප්‍රදේශවල පිහිටි නව විශේෂ ආර්ථික කලාපයක් වට කර ගෙන අධිආරක්ෂිත කලාපයක් නිර්මානය කිරීම පෙර නුවූ විරූ පියවරක් වන්නේ ය. 2002 සටන් විරාම ගිවිසුම විවෘතව ම උල්ලංඝනය කරමින් පසු ගිය සැප්තැම්බරයේ දී මිලිටරිය විසින් සිය ග්‍රහනයට නතු කර ගන්නට පෙර මෙම ප්‍රදේශය දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය යටතේ පැවතුනි.

මෙම මෑත තීන්දුව මගින් ආක්‍රමනය යුක්ති සහගත කිරීම උදෙසා ඉදිරිපත් කරන ලද සියලු මුසාවන් එලිදරව් වී තිබේ. මිලිටරි තර්කනය කුමක් වුව ද මෙම පියවරෙහි ඉලක්කය වූයේ ඉඩම් ඩැහැ ගෙන, එය දේශීය හා විදේශීය ආයෝජකයන්ට ප්‍රාදේශීය ලාභ ශ්‍රමය සූරා කෑ හැකි සුරක්ෂිත ප්‍රදේශයක් බවට පත් කිරීම යි. සාම්පූර් පිහිටා තිබෙන්නේ මූලෝපායාත්මක වැදගත්කමින් යුතු, ගැඹුරු සාගර ජලයෙන් සමන්විත ත්‍රිකුනාමල වරායට දකුනු පසිනි.

අධිආරක්ෂිත කලාපය නිර්මානය කිරීම දැනුම් දෙමින් නිකුත් කල ජනාධිපති ගැසට් නිවේදනය මැයි 30 දාතමින් යුතු වුව ද ප්‍රසිද්ධියට පත් වූයේ ජූනි මස මැද දී ය. ජනාධිපති මහින්ද රාජපක්ෂ ප්‍රදේශය පාලනය කිරීම සඳහා වූ නිසි බලධරයා ලෙස නැගෙනහිර හමුදා අන දෙන නිලධාරී මේජර් ජනරාල් පරාක්‍රම පන්නිපිටිය පත් කලේ ය. අධිආරක්ෂිත කලාපය ප්‍රධාන වශයෙන් ම දෙමල ජනයා වාසය කරන ගම්මාන 14ක් සහ ඒ හාත්පස පිහිටි සියලු ජල සම්පත් ද ආවරනය කරයි.

ජනාධිපති මහින්ද රාජපක්ෂ පසු ගිය ජූලි මස ආක්‍රමනය උදෙසා හමුදාවට අන දීමෙන් අනතුරුව මුලින් ම ඉලක්ක කර ගන්නා ලද ප්‍රදේශ අතර නැගෙනහිර මුතූර් හා සාම්පූර් විය. 2002 සටන් විරාමය ක්‍රියාත්මක වූ නතු යටතේ කිසිදු ප්‍රහාරයක් එල්ල නො වී පැවතිය දී පවා, සාම්පූර්හි පිහිටි සිය මධ්‍යස්ථානවල සිට ත්‍රිකුනාමලයේ නාවික හමුදා කඳවුරට එල්ටීටීඊයේ කාලතුවක්කු ප්‍රහාරවලින් අනතුරක් එල්ල විය හැකි යැයි මිලිටරියේ ඉහල නිලධාරින් ද කොලඹ මාධ්‍යවල කොටස් ද නැවත නැවතත් අනතුරු අඟවා තිබුනි.

ප්‍රදේශය එල්ටීටීඊ සටන්කරුවන්ගෙන් "මුදා ගෙන" නොතිබුන ද 2006 පෙබරවාරි මාසය වන වන විටත් ආන්ඩුව විශේෂ ආර්ථික කලාපයක් පිහිටුවීම සඳහා වර්ග කිලෝමීටර 675ක භූමි ප්‍රදේශයක් වෙන් කොට තිබුනි. ආයෝජන මන්ඩලය (බීඕඅයි) භාර අමාත්‍යවරයා අයෝජන සඳහා පහසුකම් සැලසීමේ අරමුනින් ත්‍රිකුනාමලයේ චීන වරාය ප්‍රදේශයෙහි කාර්යාලයක් පවා පිහිටුවී ය.

පසු ගිය අගෝස්තුවල හා සැප්තැම්බරයේ සිදු කල මිලිටරි ආක්‍රමනවල පටන් ප්‍රදේශය එල්ටීටීඊ සටන්කරුවන්ගෙන් පමනක් නො ව විශාල වසයෙන් මහජනයාගෙන් ද මුදා ගෙන තිබේ. දරුනු සටන් අතරතුර දී දසදහස් ගනන් සිවිල් වැසියන් අවතැන් වීමට ලක් වූ අතර, මඩකලපුව දිස්ත්‍රික්කයෙහි පවතින අපවිත්‍ර සරනාගත කඳවුරුවල දිවි ගෙවන අනෙකුත් ලක්ෂ ගනන් ජනයා අතරට ඔවුන් එක් වී තිබේ. දැන් ඔවුන් යලි සිය නිවෙස් හා ඉඩම් කරා ආපසු යාමෙන් වැලැක්වෙනු ඇත.

අධිආරක්ෂිත කලාප නියෝගවලට අනුව, කිසිදු පුද්ගලයෙකුට, බෝට්ටුවකට හෝ නාවික යාත්‍රාවකට නිසි බලධරයාගේ හා ඔහුගේ නියෝජිත නිලධරයන්ගේ ලිඛිත අවසරයක් නැතිව ප්‍රදේශයට ඇතුලු විය නොහැකි ය. මිලිටරියේ අනට කීකරු නොවන කවර පුද්ගලයෙකුට, බෝට්ටුවකට හෝ නාවික යාත්‍රාවකට වුව වෙඩි තැබිය හැකි ය, අත් අඩංගුවට ගත හැකි ය. මිලිටරිය අතින් සිදු වන කිසිදු මරනයක්, තුවාල වීමක් හෝ හානියක් වෙනුවෙන් කිසිදු රක්ෂන මුදලක් හෝ වන්දියක් නොගෙවනු ලැබේ. නීති උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් වැරදිකරුවන් බවට පත් වන කවරෙක් වුව ද මාස තුනත් අවුරුදු පහත් අතර කාලයක සිර දඬුවමකට සහ රුපියල් 500,000කට (එක්සත් ජනපද ඩොලර් 4,490කට) නොඅඩු දඩයකට හා අල්ලා ගත් සිය දේපල අහිමි වීමකට මුහුන දෙයි.

1983 දී සිවිල් යුද්ධය පුපුරා ගිය තැන් පටන්, මිලිටරිය ලක්ෂ ගනන් දෙමල ජනයා සිය නිවෙස්වලින් හා ඉඩම්වලින් පලවා හරිමින් උතුරෙහි හා නැගෙනහිරෙහි පිහිටි සිය කඳවුරු වටා පුලුල් අධිආරක්ෂිත කලාප ස්ථාපනය කොට තිබේ. යාපන අර්ධද්වීපයෙහි පමනක් වර්ග කිලෝමීටර 180ක භූමි ප්‍රදේශයක් ආවරනය කරමින් අධිආරක්ෂිත කලාප 15ක් ස්ථාපනය කොට තිබේ. නැගෙනහිර දී මිලිටරි සංකීර්නයන් හා කඳවුරු තුල හා අවට අධිආරක්ෂිත කලාප ගනනාවක් පිහිටුවා තිබේ. කෙසේ වුව ද, මේ වනාහි ව්‍යාපාරික අවශ්‍යතා ආරක්ෂා කිරීම උදෙසා අධිආරක්ෂිත කලාපයක් ස්ථාපනය කල පලමු වතාව යි.

දෙමල සංවිධාන ජනවාර්ගික ශුද්ධයේ ස්වරූපයක් ලෙස හඳුන්වමින් මෙම තීන්දුව හෙලා දැක තිබේ. දෙමල ජනයා සිය ඉඩම්වලින් පිටමං කිරීම යනු විශේෂ සංවේදී බවකින් සමන්විත වන ගැටලුවකි. අතීතයේ දී බලයට ආ කොලඹ ආන්ඩු, විශේෂයෙන් ම නැගෙනහිර පලාතේ දිලිඳු සිංහල ගොවීන් පදිංචි කිරීම සඳහා ඉඩ සලසා ගනු වස් විවිධ ප්‍රදේශවලින් දෙමල ජනයා පිටමං කොට තිබේ. වෙනස්කම් කිරීමේ ප්‍රතිපත්තිය ප්‍රථම කොට ම යුද්ධයට තුඩු දුන් ආතති සහගත තත්ත්වයේ එක් ප්‍රධාන මූලාශ්‍රයක් වෙයි.

එල්ටීටීඊ හිතවාදී දෙමල ජාතික සන්ධානයේ (ටීඑන්ඒ) නායක ආර්. සම්බන්ධන් ජනාධිපති රාජපක්ෂ වෙත ලිපියක් ලියමින් ප්‍රකාශ කලේ, මෙම පියවර දෙමල ජනයාගේ "ජන්ම අයිතීන්" උපුටා දැමීමක් ලෙස සලකන බව යි. දිස්ත්‍රික්කය තුල ජන වාර්ගික ව්‍යුහය තව දුරටත් වෙනස් කිරීමට දරන ප්‍රයත්න දරන බවට ආන්ඩුවට චෝදනා කල ඔහු තීන්දුව අවලංගු කරන ලෙස ආයාචනය කලේ ය.

එක් සරනාගතයෙක් පසු ගිය මාසයේ දී බීබීසී ප්‍රවෘත්ති සේවයට මෙසේ ප්‍රකාශ කලේ යඃ "ප්‍රදේශය තුල වැව් සීයකට වැඩියත් දහස් ගනන් ජනයාගේ ඉඩමුත් තියෙනවා. අපේ කෝවිල් විස්සකට වැඩිය තියෙනවා. අපේ ගම් අත ඇරලා වෙනත් තැනක පදිංචි වෙනව යි කියන එක ගැන හිතන්න වත් අමාරු යි. අපේ ඉඩම් ආපසු ලබා දෙන්න කියලත් අප සියලු දෙනා ආපහු පදිංචි කරන්න කියලත් අපි ආන්ඩුවෙන් නිහතමානීව ඉල්ලා සිටිනවා. එහෙම නො වුනොත් අපේ අයිතීන් දිනා ගන්න කර ගෙන යන අරගලය වෙනුවෙන් ඕනෑ ම දෙයක් කැප කරන්න අපි සූදානම්."

අවතැන් වූවන්ට ආන්ඩුවෙන් සහායක් අනවශ්‍ය බවත් තමන්ට අවශ්‍ය කරන්නේ තම ගම්බිම්වලට යාම සඳහා අවසරය බවත් වෙනත් ගම්වැසි කාන්තාවක් බීබීසීයට කියා සිටියා ය. "දෙවියන්ගෙ නාමෙන් කරුනාකරල අපට අපේ ගම්වල පදිංචි වෙන්න ඉඩ දෙන්න," යි ඇය කී ය.

අධිආරක්ෂිත කලාප පවතින්නේ "ඔවුන්ගේ ම ආරක්ෂාව සහ ගොඩ නැගීමට නියමිත අතිශය වැදගත් ඉදි කිරීම්වල ආරක්ෂාව සඳහා" යැයි නරුම ලෙස ප්‍රකාශ කරමින්, අධිආරක්ෂිත කලාප කරා අපසු යාමට සිවිල් වැසියන්ට ඉඩ නොලැබෙනු ඇති බව හින්දුස්ථාන් ටයිම්ස් පුවත්පතට කල අදහස් දැක්වීමක දී ආරක්ෂක ප්‍රකාශක කෙහෙලිය රඹුක්වැල්ල පිලිගත්තේ ය.

ආන්ඩුව විශේෂ ආර්ථික කලාපයට පැමිනෙන ලෙස ආයෝජකයන්ට ආරාධනා කිරීමට යන බව ද රඹුක්වැල්ල පිලිගත්තේ ය. එහෙත්, "ආර්ථික සංවර්ධන යෝජනා ක්‍රම ඇතැම් විට ජනතාව යලි පදිංචි කිරීම ඉල්ලා සිටිනු ඇති. මීට ඉස්සර, දකුනු ශ්‍රී ලංකාවේ මහවැලි වාරි යෝජනා ක්‍රමය නිසා දහස් ගනනක් අවතැන් වුනා. ඒත් ඒකට කිසි ම විරුද්ධත්වයක් මතු වුනේ නෑ," යි කියමින් ඔහු එම පියවර ආරක්ෂා කලේ ය.

රඹුක්වැල්ල පෙන්වා නො දී මග හැර ගිය දේ වන්නේ, තුවක්කු තුඩෙන් මහජනයාට ඉවත් වී යාමට බල කරමින් ආර්ථික සංවර්ධනය උදෙසා ප්‍රදේශයක් නිදහස් කර ගැනීමට මිලිටරිය යොදා ගැනීම සම්බන්ධයෙන් කිසිදු පූර්වාදර්ශයක් නොමැත්තේ ය යන්න යි. දසදහස් ගනන් ජනයා අවතැනට ගොදුරු කරමින් 1970 ගනන්වල අග හා 1980 ගනන්වල මුල් භාගයෙහි ක්‍රියාත්මක වූ මහවැලි වාරිමාර්ග යෝජනා ක්‍රමය පිලිබඳ ප්‍රශ්නයේ දී එක්සත් ජාතික පක්ෂ ආන්ඩුව පුලුල්ව පැතිර ගිය විරෝධතාවන්ට මුහුන දුන් අතර, ඉඩම් හා වන්දි ප්‍රදානය කිරීමට ඔවුන්ට බල කෙරුනි.

සාම්පූර්හි හා නැගෙනහිර මුතුර් ප්‍රදේශවල විශේෂ ආර්ථික කලාපයක් පිහිටුවීම ආන්ඩුවේ පුලුල් සැලසුමක කොටසකි. පසු ගිය නොවැම්බරයෙහි අයවැය ඉදිරිපත් කරමින් ජනාධිපති රාජපක්ෂ මෙසේ ප්‍රකාශ කලේ යඃ "ත්‍රිකුනාමලය අයෝජන හා සංචාරක කලාපයක් ලෙස ප්‍රවර්ධනය කිරීමේ අරමුනින් උතුරුදිග අධිවේගී මාර්ගයක් ඉදි කරන්නටත් උතුරු නැගෙනහිර දිස්ත්‍රික්කවල වෙනත් ප්‍රධාන මාර්ග හා පාලම් කීපයක් ඉදි කරන්නටත් ආන්ඩුව කැප වී සිටිනවා.

"ආයෝජන හා සංචාරක කලාපයක් ලෙස ත්‍රිකුනාමලය ගොඩ නැගීම සඳහා වූ යටිතල පහසුකම් සංවර්ධන සැලැස්මක් සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරිය හා ආයෝජන මන්ඩලය දැනට මත් අවසන් තීන්දුවකට පැමින හමාර යි. ඒ මගින් ආයෝජන ඇද ගැනීම උදෙසා අවශ්‍ය කරන අවදානම් ඇපකරයන්, බදු සහන, විදේශ විනිමය හා අනෙකුත් දිරි ගැන්වීම් සැපයෙනවා. කොලඹ වරාය මත ඇති වන පීඩනය අඩු කරන්නට දේශීය වානිජ අංශයේ බඩු ප්‍රවාහනය සම්බන්ධ ක්‍රියාකාරකම්වලට ත්‍රිකුනාමලය වරාය යොදා ගන්නවා."

යලි අල්ලා ගත් සාම්පූර් ප්‍රදේශයෙහි එක්සත් ජනපද ඩොලර් මිලියන 350ක පිරිවැයකින් යුතු ගල්අඟුරු බලාගාරයක් පිහිටුවීම සඳහා පසු ගිය දෙසැම්බරයේ දී ලංකා විදුලි බල මන්ඩලය ඉන්දියානු බලශක්ති අමාත්‍යාංශය සමග ගිවිසුමක් අත්සන් කලේ ය. මෙම නිවේදනය මගින් පුලුල්ව පැතිර ගිය විරෝධයක් ඇවිලී ගියේ ඉදි කිරීම සම්බන්ධ අවසන් තීන්දුව කල් දැමීමට ඉන්දියානු ආන්ඩුවට බල කරමිනි. නිසැක වශයෙන් ම, නව බලාගාරය වනාහි පැහැදිලිව ම ත්‍රිකුනාමල දිස්ත්‍රික්කය තුල වෙනත් කර්මාන්ත ශාලා ද ස්ථාපනය කිරීමේ අරමුනින් යුතුව සැකසෙන සැලසුම්වල කේන්ද්‍රීය අංගයකි.

රාජපක්ෂගේ යලි ඇරඹූ යුද්ධයට සිංහල, දෙමල හෝ මුස්ලිම් කම්කරු ජනයාගේ අවශ්‍යතාවන් සමග කිසි ම සම්බන්ධයක් නැති බවත් එය සැලසුම් කොට ඇත්තේ දිවයිනේ පාලක ප්‍රභූන්ගේ න්‍යාය පත්‍රය පෙරට ගෙන යාමට බවත් මැත ම නිවේදනය මගින් යලිත් පැහැදිලි විය.

© www.wsws.org